**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත**

# පළමු වාර පරීක්ෂණය - 2023

**11 ශ්‍රේණිය**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II**

## පිළිතුරු
### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | (2) | 11 | (2) | 21 | (2) | 31 | (3) |
| 02 | (2) | 12 | (1) | 22 | (2) | 32 | (2) |
| 03 | (3) | 13 | (1) | 23 | (3) | 33 | (4) |
| 04 | (3) | 14 | (3) | 24 | (2) | 34 | (3) |
| 05 | (2) | 15 | (1) | 25 | (4) | 35 | (2) |
| 06 | (3) | 16 | (4) | 26 | (3) | 36 | (1) |
| 07 | (3) | 17 | (4) | 27 | (2) | 37 | (4) |
| 08 | (3) | 18 | (1) | 28 | (4) | 38 | (3) |
| 09 | (3) | 19 | (1) | 29 | (1) | 39 | (4) |
| 10 | (4) | 20 | (4) | 30 | (3) | 40 | (4) |

## පිළිතුරු
### II කොටස

01. (i) (අ) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර **(ලකුණු 01 යි)**

(ආ) ඔව් **(ලකුණු 1/2 යි)**

*හේතුව - අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන නිසා* **(ලකුණු 1/2 යි)**

(ii) (අ) තනි පුද්ගල ව්‍යාපාර **(ලකුණු 01 යි)**

(ආ) ***වාසි***

- පහසුවෙන් ආරම්භ කල හැකි වීම.
- සියලුම ලාභ අයිතිකරු සතුවීම.
- ව්‍යාපාරික තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම.
- තම දක්ෂතා උපරිම යෙදිය හැකි වීම. **(ලකුණු 1/2 යි)**

***අවාසි***

- අයිතිකරුගේ වගකීම අසීමිත වීම.
- ප්‍රාග්ධනය රැස්කරගැනීමේ දුෂ්කරතා පැවතීම.
- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම. **(ලකුණු 1/2 යි)**

(iii) 1) ව්‍යාපාරය පිහිටි ඉඩම
2) සේවකයන් (ඔෂාන්)
3) යන්ත්‍ර උපකරණ, ගල් සකස් කිරීමේ අච්චු
4) අයිතිකරු - ව්‍යාපාර ක්‍රියාවලිය මෙහෙයවීම. **(ලකුණු 02 යි)**

(iv) (අ) 1) ලක්ෂිතගේ පළපුරුද්ද
2) ඔහු සතුව ඉඩමක් සහ අරමුදල් පැවතීම.
3) පළපුරුදු සේවකයෙකු සිටීම. **(ලකුණු 01 යි)**

(ආ) 1) අයිතිකරු
2) සේවකයින් **(ලකුණු 01 යි)**

(v) රු. 1,200,000 **(ලකුණු 02 යි)**

(vi) සේවක වැටුප් ගිණුම හර 25,000
බැංකු ගිණුම බැර 25,000 **(ලකුණු 02 යි)**

(vii) වත්කම් = හිමිකම + වගකීම

1,200,000 = 1,200,000 + - **(ලකුණු 02 යි)**

(viii) ජ'නල් වවුචරය → පොදු ජ'නලය **(ලකුණු 02 යි)**

(ix) ***බැංකු ගිණුම***

| | | | | | |
|---|---|---|---|---|---|
| 01/05 මුදල් | (1/2) | 50,000 | 01/06 ගැණුම් | (1/2) | 40,000 |
| | | | 01/25 සේවක වැටුප් | (1/2) | 25,000 |
| 1/31 ශේෂය ප/ගෙ | (1/2) | 15,000 | | | |
| | | **65,000** | | | **65,000** |
| | | | 1/1 ශේෂය ඉ/ගෙ | | **15,000** |

(x) 01/10 සහ 01/25

(ගණුදෙනුවක් ලියා ඇත්නම් ලකුණු දෙන්න) **(ලකුණු 02 යි)**

**(මුළු ලකුණු 02x10 = 20යි)**

02\. (i) (අ) මිනිස් අවශ්‍යතා සපුරාගන්නා විවිධ ආකාර වුවමනා ලෙස හැඳින් වේ. **(ලකුණු 01 යි)**

(ආ) 1) අත්‍යවශ්‍ය වීම
2) පොදු වීම
3) නිර්මාණය කළ නොහැකි වීම.
4) සීමිත වීම. **(ලකුණු 01 යි)**

(ii) (අ) සත්‍ය (ආ) අසත්‍ය (ඉ) අසත්‍ය (ඊ) සත්‍ය **(ලකුණු 02 යි)**

(iii) (අ) ආර්ථික **(ලකුණු 01 යි)**
(ආ) ගෑස්, සූර්ය බලය **(ලකුණු 01 යි)**

(iv) (අ) 1) අයිතිය හා පාලනය රජය සතු වීම.
2) නෛතික පුද්ගලභාවයක් තිබීම.
3) විශේෂ පනතත් හෝ පවත්නා පොදු පනතක් යටතේ ආරම්භකල හැකිය
4) අඛණ්ඩ පැවැත්මක් තිබීම. **(ලකුණු 01 යි)**

(ආ) 1) අයිතිය හා පාලනය රජය සතුවීම.
2) නීතිමය කටයුතු වලදී දෙපාර්තමේන්තු ප්‍රධානියා සිය නිල නාමයෙන් පෙනී සිටිය යුතු වීම.
3) අඛණ්ඩ පැවැත්ම
4) අරමුදල් රජය මගින් සැපයීම. **(ලකුණු 01 යි)**

**(මුළු ලකුණු 02x4 = 08යි)**

03\. (i) (අ) 1) ව්‍යාපාරයේ ප්‍රාග්ධන ප්‍රමාණය
2) සේවක සංඛ්‍යාව
3) භාවිත කරන බලශක්ති ප්‍රමාණය
4) ව්‍යාපාරයට ඇති වෙළඳපොල කොටස **(ලකුණු 01 යි)**

(ආ) 1) පහසුවෙන් ආරම්භ කළ හැකි වීම.
2) වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි වීම.
3) හවුල්කරුවන් සතු විවිධ දක්ෂතා ප්‍රයෝජනයට ගත හැකි වීම.
4) වගකීම හවුල්කරුවන් අතර බෙදීයාම.
5) සාමූහික තීරණ ගත හැකි වීම. **(ලකුණු 01 යි)**

(ii) (අ) අසත්‍ය (ආ) සත්‍ය (ඉ) අසත්‍ය (ඊ) අසත්‍ය **(ලකුණු 02 යි)**

(iii) (අ) ජංගම ගිණුම් හිමියෙකු විසින් නිශ්චිත මුදලක් එහි නම් සඳහන් පුද්ගලයාට හෝ රැගෙන එන අයෙකුට ගෙවන ලෙස බැංකුවට කරනු ලබන ලිඛිත නියෝගය චෙක්පත ලෙස හැඳින්වේ. **(ලකුණු 01 යි)**

(ආ) 1) රක්ෂණ හිමිකම
2) උපරිම විශ්වාසය
3) හානිපූර්ණය **(ලකුණු 01 යි)**

(iv) (අ) 1) ගමනාන්තය දක්වා ම යොදාගත හැකි වීම.
2) ඕනෑම වේලාවක යොදාගත හැකි වීම. **(ලකුණු 01 යි)**

(ආ) 1) වේගය වැඩි වීම.
2) සුවපහසුව වැඩි වීම.
3) ජාත්‍යන්තර වෙළඳාම සඳහා පිටුවහලක් වීම. **(ලකුණු 01 යි)**

**(මුළු ලකුණු 02x4 = 08යි)**

04. (i) (අ) භාණ්ඩ හා සේවා මිලට ගැනීම හා විකිණීම වෙළඳාම නම් වේ. **(ලකුණු 01 යි)**

(ආ) 1) බැංකු සේවා
2) රක්ෂණ සේවා
3) සන්නිවේදන සේවා
4) ප්‍රවාහන සේවා **(ලකුණු 01 යි)**

(ii) (අ) අසත්‍ය (ආ) සත්‍ය (ඉ) අසත්‍ය (ඊ) සත්‍ය

**(ලකුණු 02 යි)**

(iii) 1) සැලසුම්කරණය
2) සංවිධානකරණය
3) මෙහෙයවීම
4) පාලනය **(ලකුණු 02 යි)**

(iv) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වටිනාකමකින් යුත් නිෂ්පාදිතයක් නිර්මාණය කිරීමේ හා පිළිගැන්වීමේ ක්‍රියාවලිය අලෙවිකරණයයි. **(ලකුණු 02 යි)**

**(මුළු ලකුණු 02x4 = 08යි)**

05. (i) (අ) ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මැති පාර්ශව වල තීරණ ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමේ ක්‍රියාවලිය ගිණුම්කරණය ලෙස හැඳින්වේ.

**(ලකුණු 02 යි)**

(ආ) 1) අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවීම.
2) ව්‍යාපාරයේ පාලනයට යටත් වීම.
3) අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම. **(ලකුණු 02 යි)**

(ii)

| ***ගණුදෙනු අංකය*** | ***වත්කම්*** | = ***හිමිකම්*** | + ***වගකීම්*** | |
|---|---|---|---|---|
| 2 | +100 000 (බඩු තොග)<br>-100 000 (මුදල්) | = | | (01) |
| 3 | +200 000 (මුදල්) | = | +200 000 (බැංකු ණය) | (01) |
| 4 | -2 000 (බඩු තොග) | = -2 000 (ගැනිලි) | | (01) |
| 5 | -5 000 (මුදල්) | = -5 000 (සේවක වැටුප්) | | (01) |

(iii)

| දිනය | ඉන්වොයිසිස් අංකය | සැපයුම්කරු | මුළු වටිනාකම | |
|---|---|---|---|---|
| 2023.02.02 | 320 | සහන් | 10 000 | (01) |
| 2023.02.09 | 160 | සංජන | 12 000 | (01) |
| 2023.02.28 | | ගැණුම් ගිණුමට හර කළා | **22 000** | (1/2) |

**ගැණුම් ගිණුම**

| | | | | |
|---|---|---|---|---|
| 02/28 ණය හිමි | 22 000 | | | (1/2) |

**සහන්**

| | | | | |
|---|---|---|---|---|
| | | 02/02 ගැණුම් | 10 000 | (1/2) |

**සංජන**

| | | | | |
|---|---|---|---|---|
| | | 02/09 ගැණුම් | 12 000 | (1/2) |

**(මුළු ලකුණු 12යි)**

06. (i) (අ) සුළු මුදල් අග්‍රිමය අවසාන වීමට ආසන්න වූ විට වියදම් කල මුදලට සමාන මුදලක් නැවත ප්‍රධාන මුදල් භාරකරුගෙන් සුළු මුදල් භාරකරු ලබාගෙන අග්‍රිමය සම්පූර්ණ කිරීම සුළු මුදල් වියදම් ප්‍රතිපූර්ණය කිරීම ලෙස හඳුන්වයි.

**(ලකුණු 02 යි)**

(ආ) 1) ජංගම නොවන වත්කම් ණයට ගැනීම
2) වෙළඳ භාණ්ඩ තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගැනීම.
3) වැරදි නිවැරදි කිරීමේ සටහන්
4) ගැළපුම් සටහන් **(ලකුණු 02 යි)**

(ii) **සුළු මුදල් පොත**

| ලැබීම් | දිනය | විස්තරය | ගෙවීම් | විශ්ලේෂණ තීරු: ගමන් වියදම් | ලිපි ද්‍රව්‍ය වියදම් | සංග්‍රහ වියදම් | විවිධ වියදම් | ලෙජර් ගිණුම් |
|---|---|---|---|---|---|---|---|---|
| 2000 | 02.01 | මුදල් | | | | | | |
| | 02.01 | ගමන් වියදම් | 160 | 160 | | | | |
| | 02.02 | ලිපිද්‍රව්‍ය වි. | 130 | | 130 | | | |
| | 02.03 | රුවන් | 150 | | | | | 150 |
| | 02.06 | සංග්‍රහ වි. | 165 | | | 165 | | |
| | 02.07 | කුලී රථ ගා. | 150 | 150 | | | | |
| | 02.08 | කම්කරු කුලී | 150 | | | | 150 | |
| | 02.09 | පරිගණක උ. | 500 | | | | 500 | |
| | 02.10 | කාබන් කො. | 110 | | 110 | | | |
| | 02.11 | සංග්‍රහ වි. | 125 | | | 125 | | |
| | 02.14 | පරිත්‍යාග | 200 | | | | 200 | |
| | 02.14 | ලිපිද්‍රව්‍ය වි. | 130 | | 130 | | | |
| | | | 1970 | 310 | 370 | 290 | 850 | 150 |
| | 02.14 | ශේ/ප/ගෙ(1/2) | 30 | (1/2) | (1/2) | (1/2) | (1/2) | (1/2) |
| 2000 | | | 2000 | | | | | |
| 30 | 02.15 | ශේ/ඉ/ගෙ | | | | | | |
| 1970 | 02.15 | මුදල් | | | | | | |

***මුදල් ගිණුම***

| | | | | (1/2) |
|---|---|---|---|---|
| | | 02/01 සුළු මුදල් | 2 000 | |
| | | 02/15 සුළු මුදල | 1 970 | |

***ගමන් වියදම්***

| | | | | (1/2) |
|---|---|---|---|---|
| 02/14 සුළු මුදල් | 310 | | | |

***ලිපිද්‍රව්‍ය වියදම්***

| | | | | (1/2) |
|---|---|---|---|---|
| 02/14 සුළු මුදල් | 370 | | | |

***සංග්‍රහ වියදම්***

| | | | | (1/2) |
|---|---|---|---|---|
| 02/14 සුළු මුදල් | 290 | | | |

***විවිධ වියදම්***

| | | | | (1/2) |
|---|---|---|---|---|
| 02/14 සුළු මුදල් | 850 | | | |

***රුවන්***

| | | | | (1/2) |
|---|---|---|---|---|
| 02/03 සුළු මුදල් | 150 | | | |

(iii)

***පොදු ජ'නලය***

| ***දිනය*** | ***විස්තරය*** | ***හර*** | ***බැර*** | |
|---|---|---|---|---|
| 02/10 | උපකරණ ගිණුම (හර)<br>සීමිත දේශාන් සමාගමේ ගිණුම<br>(සීමිත දේශාන් සමාගමෙන් රු.30000ක උපකරණයක් ණයට ගැනීම වාර්ථා කිරීම) | 30 000 | 30 000 | (01) |

***උපකරණ ගිණුම***

| | | | | (1/2) |
|---|---|---|---|---|
| 02/10 සීමිත දේශාන් සමා. | 30000 | | | |

***සීමිත දේශාන් සමාගම***

| | | | | (1/2) |
|---|---|---|---|---|
| | | 02/10 උපකරණ ගිණුම | 30000 | |

**(මුළු ලකුණු 12යි)**

07. (i) (අ) ශේෂ පිරික්සුමේ හර ශේෂ එකතුව සහ බැර ශේෂ එකතුව අතර වෙනසක් ඇති විටෙක ඊට හේතු වූ ගිණුම්කරණ වැරදි සොයා ඒවා නිවැරදි කරන තෙක් ශේෂ පිරික්සුමේ වෙනස තාවකාලිකව සටහන් කරන ගිණුම අවිනිශ්චිත ගිණුම ලෙස හැඳින්වේ.

**(ලකුණු 02 යි)**

(ආ) 1) අවශ්‍ය ශ්‍රමය අවම වීම තුලින් මුදල් ඉතිරි වේ.
2) කාලීන දත්ත පහසුවෙන් ලබාගත හැකි වීම.
3) ස්වයංක්‍රීයව නිමවන ගිණුම් වාර්තාවල නිරවද්‍යතාව ඉහළ වීම.
4) කාලය ඉතිරි වීම. **(ලකුණු 02 යි)**

(ii)

***සංශෝධිත බැංකු ගිණුම***

| | | | | | |
|---|---|---|---|---|---|
| ශේෂය | | 30 000 | බැංකු ගාස්තු | (01) | 500 |
| ණයගැති ප්‍රේෂණ | (01) | 6 000 | | | |
| | | | ශේ/ප/ගෙ | (01) | 45 500 |
| | | **46 000** | | | **46 000** |
| ශේෂය ඉ/ගෙ | | 45 500 | | | |

***බැංකු සැසඳුම් විස්තරය***

| | | |
|---|---|---|
| සංශෝධිත බැංකු ශේෂය | | 45 500 |
| + බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් | (01) 5 000 | 5 000 |
| | | **50 500** |
| (-) නිෂ්කාශනය නොවූ චෙක්පත් | (01) 7 000 | (7 000) |
| බැංකු ප්‍රකාශනයට අනුව බැංකු ශේෂය | | (01) **43 500** |

**(ලකුණු 06 යි)**

(iii)

***පොදු ජ'නලය***

| ***දිනය*** | ***විස්තරය*** | ***හර*** | ***බැර*** | |
|---|---|---|---|---|
| I | ගැණුම් ගිණුම (හර) | 5 000 | | |
| | ණය හිමි ගිණුම | | 5 000 | (01) |
| | (මග හැරුණු ගැණුම් ඉන්වොයිසිය වාර්තා කිරීම) | | | |
| II | ණය ගැති ගිණුම (හර) | 18 000 | | |
| | විකුණුම් ගිණුම | | 18 000 | (01) |
| | (ණයට විකුණුම් අඩුවෙන් වාර්තා වීම නිවැරදි කිරීම) | | | |

**(ලකුණු 02 යි)**
**(මුළු ලකුණු 12 යි)**